බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන දිස්ත්‍රික් නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම - 2026

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන දිස්ත්‍රික් නිලධාරි තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් ලත් අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. **වැටුප් පරිමාණය**

මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රා.ප.ව 10/2025 අනුව රු.71,240-11×1,360-18×1,850-119,500/- වේ. වැටුප් කේත අංකය MN 7-2025 වේ.

03. **සේවා කොන්දේසි**

i) මෙම තනතුර ස්ථීරය. විශ්‍රාම වැටුප් සහිතය.

ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හා බස්නාහිර පළාත් සභාවේ ආයතන සංග්‍රහයටද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයටද, රජයේ හා බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසි වලටද, දිස්ත්‍රික් සමූපකාර සංවර්ධන නිලධාරී බඳවා ගැනීමේ පරිපාටියටද , රජයේ හා බස්නාහිර පළාත් සභාවේ වෙනත් රෙගුලාසි වලටද, චක්‍රලේඛ හා උපදෙස් වලටද , ඒවාට අදාළ වරින් වර නිකුත් කරනු ලබන සංශෝධන වලටද ඔබ යටත් විය යුතු වේ.

04. **පවත්නා පුරප්පාඩු ක්ෂේත්‍රයන්**

දිස්ත්‍රික් සමූපකාර සංවර්ධන නිලධාරි තනතුරෙහි පුරප්පාඩු 02 ක් පවති. මෙම තනතුරෙහි පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

4.1 අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2026.12.02 දින වේ.

05. **සුදුසුකම්**

5.1. පළපුරුද්ද

බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන නිලධාරි තනතුරේ I වන ශ්‍රේණියේ වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ පාලන චක්‍රලේඛ අංක 04/2021 හි සඳහන් විධි විධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

5.2. කායික සුදුසුකම්

තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

5.3.වෙනත්

පහත සඳහන් පරිදි වෙනත් සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය:

i. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

ii. යහපත් චරිතයකින් යුක්ත වීම

iii. මෙම තනතුරට බඳවා ගැනීමට අදාළ නිවේදනයේ සඳහන් සියළුම සුදුසුකම් **2026.12.02** දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

06. බඳවා ගැනීමේ ක්‍රමය:

ධාරාව	ප්‍රතිශතය
විවෘත	-
සීමිත	-
කුසලතා	100%

6.1. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු : ලකුණු ලබා දීමක් සිදු නොකරන අතර මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කරනු ලැබේ

6.2. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ	උපරිම ලකුණු ප්‍රමාණය	තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය
අතිරේක සේවා පළපුරුද්ද	60	ලකුණු ලබා ගැනීමේ කුසලතා අනුපිළිවෙල අනුව උපරිම ලකුණු ලබා ගන්නා අයගෙන් පුරප්පාඩු පුරවනු ලැබේ.
සේවා නිපුණතාවය	25	
රහස්‍යතා වාර්තා	10	
සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව	05	

6.2.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්

ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර	උපරිම ලකුණු ප්‍රමාණය	තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය
1. <u>අතිරේක සේවා පළපුරුද්ද</u> බඳවා ගැනීමේ සුදුසුකම සඳහා සලකා බලන වසර 05ට අමතරව සමුපකාර සංවර්ධන නිලධාරී I ශ්‍රේණියේ සේවා කාලය සඳහා පාලන චක්‍රලේඛ අංක 01/2022 අනුව ලකුණු ලබා දෙනු ලැබේ.	**60**	ලකුණු ලබා ගැනීමේ කුසලතා අනුපිළිවෙල අනුව උපරිම ලකුණු ලබා ගන්නා අයගෙන් පුරප්පාඩු පුරවනු ලැබේ.
2. <u>සේවා නිපුණතාවය</u> I. සමුපකාර සංවර්ධන නිලධාරියෙකු වශයෙන් වසර 05 ක සේවා කාලය සම්පූර්ණ කල පසු, බස්නාහිර පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තියේ 58 වගන්තිය යටතේ තීරකවරයෙකු / බෙරුම්කරුවෙකු ලෙස කටයුතු කර තිබීම (ලකුණු 03)	**25**	

II. සමුපකාර සංවර්ධන නිලධාරියෙකු වශයෙන් වසර 05 ක සේවා කාලය සම්පූර්ණ කල පසු, දිස්ත්‍රික් කාර්යාලයක සමුපකාර සංවර්ධන නිලධාරියෙකු ලෙස කටයුතු කරන අවස්ථාවක, විගණන නිලධාරියෙක් වශයෙන් උපරිම වසර 02ක් කටයුතු කර තිබීම (එක් වසරකට ලකුණු 04 බැගින්) හෝ සමුපකාර සංවර්ධන නිලධාරියෙකු වශයෙන් වසර 05ක සේවා කාලය සම්පූර්ණ කළ පසු, ප්‍රධාන කාර්යාලයේ සමුපකාර සංවර්ධන නිලධාරියෙකු ලෙස කටයුතු කරනු ලබන නිලධාරියෙකුට වසරකට අවම වශයෙන් විගණන දෙකකට අදාළව වසර දෙකක විගණනය සඳහා (එක් විගණනයකට ලකුණු 04 බැගින්) (මුළු ලකුණු ප්‍රමාණය 08) III. සමුපකාර සංවර්ධන නිලධාරියෙකු වශයෙන් වසර 05ක සේවා කාලය සම්පූර්ණ කළ පසු, බස්නාහිර පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තියේ 46 සහ 47 වගන්ති යටතේ කරනු ලබන විභාගයක් / විමර්ශනයක් / පොත්පත් පරීක්ෂාවක් සිදු කර අවසන් කර තිබීම (එක් විභාගයකට / විමර්ශනයකට / පොත්පත් පරීක්ෂාවකට ලකුණු 02 බැගින් අවස්ථා 04 ක් සඳහා) (ලකුණු 08) IV. දිස්ත්‍රික් කාර්යාලයක සමුපකාර සංවර්ධන නිලධාරියෙකු වශයෙන් වසර 05 ක සේවා කාලය සම්පූර්ණ කළ පසු අවම වශයෙන් එක් සමුපකාර සමිතියක ඇවරකරුවෙකු ලෙස කටයුතු කර ඇවරය අවසන් කර තිබීම. (ලකුණු 06)		
<u>රහස්‍යතා වාර්තා</u> (වාර්ෂික රහස්‍යතා වාර්තා වල පහත දැක්වෙන ක්ෂේත්‍ර පදනම් කරගෙන ලකුණු දෙනු ලැබේ) i) චරිතය හා ස්වීයත්වය ii) ප්‍රතිභානය iii)රාජකාරී ඉටු කිරීම iv) සමිතිවල විගණන පරීක්ෂණය හා අධීක්ෂණය	**10**	
විශිෂ්ඨ අන්දමින් සුදුසුකම් ලැබ ගෙන - ලකුණු 10		
උසස් සේ සුදුසු ව - ලකුණු 08		
සුදුසු ව - ලකුණු 05		

3. <u>සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය</u>			
සන්නිවේදන හැකියාව	- ලකුණු 02	05	
නායකත්වය	- ලකුණු 02		
පෞරුෂත්වය	- ලකුණු 01		
මුළු ලකුණු		**100**	

07. **අයදුම් කිරීමේ ක්‍රමය:**

(i) අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපසම භාවිතා කරමින් A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙළ කර අපේක්ෂකයා තම අත් අකුරින්ම පැහැදිලිව පිරිවිය යුතුය

(ii) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **2026.12.02** වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 628, 10 වන මහල, ජන ජය සිටි ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය" වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන දිස්ත්‍රික් නිළධාරි තනතුරට බඳවා ගැනීම - 2026"** යන්න පැහැදිලි ලෙස සඳහන් කර තම ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා, අමාත්‍යාංශ ලේකම් මඟින් ඔවුන්ගේ නිර්දේශ සහිතව එවිය යුතුය. නියමිත දිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාරගනු නොලැබේ.

(iii) අයදුම්පතක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපැල්දී නැතිවූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසන් දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි හානිය අයදුම්කරු විසින් විඳ දරා ගත යුතුය. එමෙන්ම අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

08. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වේ.

09. මෙම දැන්වීම හා ආදර්ශ අයදුම් පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේද පළ කර ඇත.

නිලක් සෙනරත්
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

2026.11.05 දින,
බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 628,
10 මහල , ජනජය සිටි ගොඩනැගිල්ල
නාවල පාර ,
රාජගිරිය.

ආදර්ශ අයදුම්පත්‍රය

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන දිස්ත්‍රික් නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම - 2026

1. නම (මුලකුරු සමඟ) : .....

2. මුලකුරු සමඟ සම්පූර්ණ නම : .....

.....

3. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

4. ස්ත්‍රී/පුරුෂ භාවය (අදාළ කොටුව තුළ "√"ලකුණ යොදන්න)

ස්ත්‍රී ☐ පුරුෂ ☐

5. විවාහක/අවිවාහක බව (අදාළ කොටුව තුළ "√"ලකුණ යොදන්න)

විවාහක ☐ අවිවාහක ☐

6. උපන්දිනය වර්ෂය: ☐☐☐☐ මාසය: ☐☐ දිනය: ☐☐

7. දුරකථන අංකය

කාර්යාලීය : ☐☐☐☐☐☐☐☐☐☐ ජංගම : ☐☐☐☐☐☐☐☐☐☐

8. දැනට සේවය කරන දෙපාර්තමේන්තුව, සේවා ස්ථානය හා එහි ලිපිනය : .....

.....

9. සේවය ස්ථිර කරන ලද් දිනය : .....

10. 10.1 මුල් පත්වීමේ දිනය : .....

10.2 මුල් තනතුර : .....

11. බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන නිලධාරී තනතුරේ I වන ශ්‍රේණියට පත් වූ දිනය :

.....

12. ඔබ විසින් සමුපකාර සංවර්ධන නිලධාරී I වන ශ්‍රේණියට අදාළව සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් නියමිත දිනට සමත් වී තිබේද?

.....

13. 13.1 ඔබ සමුපකාර සංවර්ධන නිලධාරී I වන ශ්‍රේණියට අදාළ සියළු වැටුප් වර්ධක උපයාගෙන තිබේද?

.....

13.2 වැටුප් වර්ධක උපයාගෙන නොමැතිනම් ඒ පිළිබඳ විස්තර දක්වන්න

.....

14. 14.1 ඔබ සමුපකාර සංවර්ධන නිලධාරී I වන ශ්‍රේණියට පත්වීමෙන් පසු වැටුප් රහිත නිවාඩු / වැටුප් රහිත විදේශ නිවාඩු ලබා තිබේද?

.....

14.2 ලබා තිබේ නම් කාල සීමාවන් සඳහන් කරන්න

.....

15. 15.1 පාලන චක්‍රලේඛ 04/2021 අනුව ඔබ විනයානුකූල දඬුවමකට ලක් වී තිබේ ද?

.....

15.2 විනයානුකූලව දඬුවම් කර තිබෙනම් ඒ පිළිබඳ විස්තර දක්වන්න

.....

මා විසින් ඉහතින් සඳහන් කර ඇති සියළුම තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් එම තොරතුරු සාවද්‍ය යැයි තහවුරු වුවහොත් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන දිස්ත්‍රික් නිලධාරී තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමටද, මට විරුද්ධව විනයානුකූල කටයුතු කරනු ලැබීමටද හැකි බව මම හොඳාකාරවම දනිමි.

....

දිනය නිලධාරියාගේ අත්සන

16. <u>ආයතන ප්‍රධානියාගේ සහතිකය</u>
(අනවශ්‍ය වචන කපා හරින්න)

16.1 මෙම ආයතනයේ සේවයේ නියුතු ..... මහතා/මහත්මියගේ පෞද්ගලික ලිපිගොනුව අනුව මෙම නිලධාරියා/නිලධාරිනිය කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටු කරන/නොකරන බවත්,

16.2 මෙම නිලධාරියා/නිලධාරිනිය I වන ශ්‍රේණියේ නිලධාරියෙකු/නිලධාරිනියක බවත්, ඔහු/ඇය විසින් සමුපකාර සංවර්ධන නිලධාරී I වන ශ්‍රේණියට අදාළව සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් නියමිත දිනට සමත් වී ඇති/නැති බවත්,

16.3 මෙම නිලධාරියා/නිලධාරිනිය සමුපකාර සංවර්ධන නිලධාරී I වන ශ්‍රේණියට අදාළව උපයාගත යුතුව තිබූ සියළු වැටුප් වර්ධක උපයාගෙන ඇති/නැති බවත්,

16.4 මෙම නිලධාරියා/නිලධාරිනිය සමුපකාර සංවර්ධන නිලධාරී I වන ශ්‍රේණියට අදාළව දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කර ඇති/නැති බවත්,

16.5 මෙම නිලධාරියා/නිලධාරිනිය පාලන චක්‍රලේඛ 04/2021 අනුව විනයානුකූල දඬුවමකට ලක්වී ඇති/නැති බවත් එසේ සිදු කිරීමට අදහස් කරන බවත්/නොකරන බවත්,

16.6 මෙම නිලධාරියා/නිලධාරිනියට සමුපකාර සංවර්ධන නිලධාරී I වන ශ්‍රේණියේ අදාළව සක්‍රිය සේවා කාලයක් ඇති/නැති බවත්,

සටහන - වැටුප් රහිත නිවාඩු/ වැටුප් රහිත විදේශ නිවාඩු ලබා තිබේ නම්, වැටුප් වර්ධක උපයාගෙන නොමැති නම්, විනය විරෝධී කටයුත්තක් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර ඇත්නම් හෝ විනයානුකූලව කටයුතු කිරීමට හෝ අදහස් කරන්නේ නම්, ඒ පිළිබඳ විස්තර දක්වන්න.

.....
.....

මෙම නිලධාරියා/නිලධාරිනිය බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන දිස්ත්‍රික් නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය අනුව සියළුම සුදුසුකම් සපුරා ඇති/නැති බව නිර්දේශ කරමි.

....

දිනය ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

17. <u>දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය</u>

ඉහත නිර්දේශය හා එකඟ වෙමි/නොවෙමි.

....

දිනය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

18. <u>අමාත්‍යාංශ ලේකම් (බ.ප) ගේ නිර්දේශය</u>

ඉහත නිර්දේශය හා එකඟ වෙමි/නොවෙමි.

....

දිනය අමාත්‍යාංශ ලේකම් (බ.ප) ගේ අත්සන හා නිල මුද්‍රාව